03 ඒකකය - පූර්ණ සංඛ්‍යා මත ගණිත කර්ම

✓ සංඛ්‍යාත්මක ප්‍රකාශන සුළු කිරීමේ දී පහත දැක්වෙන පිළිවෙළ අනුගමනය කළ යුතු වේ.

- පළමු ව වරහන් තුළ කොටස සුළු කිරීම ද
- දෙවනු ව බෙදීම් සහ ගුණ කිරීම් වමත් පස සිට දකුණත් පසට සුළු කිරීම ද
- ඉන් පසු එකතු කිරීම් හා අඩු කිරීම් වමත් පස සිට දකුණත් පසට සුළු කිරීම ද කළ යුතු ය.

නිදසුන 1

$7 - 4 + 5$ සුළු කරන්න.

$7 - 4 + 5 = 3 + 5$

$= 8$

නිදසුන 2

$80 \div 10 \times 5$ සුළු කරන්න.

$80 \div 10 \times 5 = 8 \times 5$

$= 40$

නිදසුන 3

$4 \times 6 \div 3$ සුළු කරන්න.

$4 \times 6 \div 3 = 24 \div 3$

$= 8$

නිදසුන 4

$25 + 10 - 7$ සුළු කරන්න.

$25 + 10 - 7 = 35 - 7$

$= 28$

නිදසුන 5

$28 \div 2 - 3$ සුළු කරන්න.

$28 \div 2 - 3 = 14 - 3$

$= 11$

නිදසුන 6

$50 - 10 \times 3$ සුළු කරන්න.

$50 - 10 \times 3 = 50 - 30$

$= 20$

නිදසුන 7

$18 \times 5 - 62$ සුළු කරන්න.

$18 \times 5 - 62 = 90 - 62$

$= 28$

නිදසුන 8

$50 - 10 \div 2$ සුළු කරන්න.

$50 - 10 \div 2 = 50 - 5$

$= 45$

නිදසුන 9

$5 + 6 \div 3 + 2$ සුළු කරන්න.

$5 + 6 \div 3 + 2 = 5 + 2 + 2$

$= 9$

නිදසුන 10

$2 \times 12 \div 3 \times 5$ සුළු කරන්න.

$2 \times 12 \div 3 \times 5 = 24 \div 3 \times 5$

$= 8 \times 5 = 40$

නිදසුන 1

$20 \div (12 - 7)$ සුළු කරන්න.

$20 \div (12 - 7) = 20 \div 5 = 4$

නිදසුන 2

$5 \times (10 + 12) \div 11$ සුළු කරන්න.

$5 \times (10 + 12) \div 11 = 5 \times 22 \div 11$

$= 110 \div 11 = 10$

➢ **ඔබේ පෙළ පොතෙහි 3.1, 3.2, 3.3, 3.4 අභ්‍යාස සම්පූර්ණ කරන්න.**